ගොවිකටයුතු පුවත් හසුන

HARTI

ISSN 1991-040x

46 වෙළුම | සංවත්සර කලාපය | 2022 ජනවාරි - මාර්තු

# ගොවිකටයුතු පර්යේෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමියාට වසර 50යි

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සිය අභිමානවත් 50 වන සංවත්සරය පසුගිය පෙබරවාරි මස 21 වන දින සමරනු ලැබීය. වසර 50ක් තිස්සේ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ක්ෂේත්‍රයේ පුරෝගාමී මෙහෙවරක් ඉටු කරමින් සිටින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය 50වන සංවත්සරය ඉතා චාම් නමුත් අභිමානවත් අයුරින් සැමරීම විශේෂත්වයකි.

50වන සංවත්සරය නිමිත්තෙන් පණිවුඩයක් නිකුත් කරමින් අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී මාලින්ද සෙනෙවිරත්න මහතා සඳහන් කළේ 'ශිෂ්ටාචාරය තුළ අප පැමිණ ඇත්තේ කෙටි ගමනක් වන අතර අපේ ඉදිරි ගමන තව සියවස් ගණනක් කරා ඇදී යනු ඇති බවයි. එසේම අප උත්පාදනය කරගන්නා තොරතුරු සහ දැනුම අදට වගේම ඉදිරි පරම්පරාවටත් වැදගත් වන ආකාරයට එකතු කළ යුතු බව ද එම පණිවුඩයෙහි වැඩි දුරටත් සඳහන් වේ.

## අධ්‍යක්ෂතුමාගේ සම්පූර්ණ පණිවුඩය

"පසුගිය වසර 50 තුළ අප ආයතනයේ කාර්යභාරය වී තිබෙන්නේ කෘෂිකර්මාන්තයට අදාළ සමාජ, ආර්ථික, දේශපාලන පාරිසරික කරුණු කාරණා පිළිබඳ පර්යේෂණ සිදු කර ඒ ලබා ගන්නා තොරතුරු හරහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට අවබෝධයක් ලබා දීම සහ ප්‍රතිපත්ති සම්පාදනයට නිර්දේශ නිකුත් කිරීමයි. අප ලබා ගන්නා තොරතුරු සහ විශ්ලේෂණයන් ජනගත කිරීමටත් අපගේ වගකීමක් තිබේ. වර්තමාන තත්ත්වය ගත් විට පසුගිය අවුරුදු 50 තුළ අපේ ලෝකය වෙනස් වී තිබේ.





කෘෂිකර්මාන්තයට අදාළ ක්‍රමවේදයන් වෙනස් වී තිබේ. තාක්ෂණය දියුණු වී තිබේ. පරිසර පද්ධතීන්ට විශාල තර්ජන එල්ල වී තිබේ.

ඉදිරියේ දී අපට පැවරී ඇත්තේ එම වෙනස් වන තත්ත්වයන්ට අදාළ ව කෘෂිකර්ම ප්‍රතිපත්ති පැවතිය යුත්තේ කෙසේ ද යන්න තීරණය කිරීමයි. ඊට අදාළව අපේ ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුමෙන් ශක්තිමත් කිරීම අපිට පැවරී තිබේ. අපේ ශිෂ්ටාචාරයට වසර 2500කට ඇත ඉතිහාසයක් ඇත. අපේ ආයතනයට වසර 50යි. ශිෂ්ටාචාරය තුළ අප පැමිණ ඇත්තේ කෙටි ගමනක් වන අතර අපේ ඉදිරි ගමන තව සියවස් ගණනක් කරා ඇදී යනු ඇත. අප උත්පාදනය කරගන්නා ඇත. තොරතුරු සහ දැනුම අදට වගේම ඉදිරි පරම්පරාවටත් වැදගත් වන ආකාරයට එකතු කළ යුතු වේ. එවිට ඒ පිළිබඳව ඉතාම වගකීමෙන් කටයුතු කරන ආයතනයක් බවට තමයි අප ඉදිරියේ දී පත්විය යුත්තේ."

50වන සංවත්සර උත්සවය මහින්ද සිල්වා ශ්‍රවණාගාරයේ දී පැවති අතර උත්සවයේ ආරාධිත දේශනය සිදු කරනු ලැබුවේ ප්‍රවීණ ලේඛකයෙකු සහ කවියෙකු වන මහින්ද ප්‍රසාද් මස්ඉඹුල මහතා ය.

## පුස්තකාල ග්‍රන්ථ නාමාවලිය එළි දැක්වීම



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පුස්තකාලය පරිශීලනය කරන පාඨකයින්ගේ පහසුව උදෙසා සකස් කළ Bibliography of HARTI Publications ග්‍රන්ථ නාමාවලිය එළි දැක්වීම 50 වන සංවත්සර සැමරුම් උත්සව අවස්ථාවේ දී සිදුවිය.

සහකාර පුස්තකාලයාධිපතිනි යමුනා වීරරත්න මහත්මිය විසින් සම්පාදිත මෙම කෘතියේ පළමු පිටපත අප ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ගාමිණී සෙනෙවිරත්න මහතා වෙත පිළිගැන්වුණි.

















## පනස් වන සංවත්සරය වෙනුවෙන් ශ්‍රමදාන වැඩසටහන් මාලාවක්

පෙබරවාරි මස 21 දිනට යෙදුණු ආයතනයේ 50වන සංවත්සරය නිමිතිකොට ගෙන ආයතන පරිශ්‍රය පිරිසිදු කිරීම, අලංකරණය සහ සුදුහුණු පිරියම් සඳහා වූ ශ්‍රමදාන වැඩසටහන් මාලාවකට ආයතනයේ සියලුම සේවක මහත්ම මහත්මීහු සහභාගී වූහ.

ආයතනයේ වටපිටාව පිරිසිදු ව මෙන් ම එහි ගෘහ නිර්මාණාත්මක වටිනාකම් වඩාත් කැපී පෙනෙන පරිදි ආයතනය අලංකාර කිරීම සඳහා සියලු දෙනා එකාවන් ව කැප වී සහයෝගයෙන් කටයුතු කිරීම අධ්‍යක්ෂතුමාගේ විශේෂ ඇගයීමට ද ලක් විය.

## සර්ව රාත්‍රික පිරිත් පිංකම

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 50වන සංවත්සරය නිමිත්තෙන් සර්ව රාත්‍රික පිරිත් දේශනාවක් පැවැත්වුණි. ආයතනයේ සුබ සාධක සංගමය විසින් සංවිධානය කළ පිරිත් පිංකම සඳහා බොරැල්ල අතුල දස්සන විහාරස්ථානයේ විහාරාධිකාරී අතිපූජ්‍ය බොරැල්ලේ අතුල ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඇතුළු භික්ෂූන් වහන්සේලා සහභාගී වූහ. සධාතුක කරඬුව වැඩම කරනු ලැබුයේ ආයතනයේ අධ්‍යක්ෂ මාලින්ද සෙනෙවිරත්න මහතා විසිනි.

පිංකම වෙනුවෙන් ආයතනයේ සියලුම කාර්යමණ්ඩලය තම උපරිම දායකත්වය ලබා දුන්හ. පිරිත් පිංකම අවසානයේ භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් උදෑසන හීල් දානය පූජා කිරීම ද සිදු විය.

# පුළුල් මට්ටමේ ශාස්ත්‍රීය හා පුහුණු අත්දැකීම් හුවමාරුවක් සඳහා අවබෝධතා ගිවිසුම් දෙකක්





ගොවිජන හා කෘෂිකාර්මික පර්යේෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමියෙකු වශයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ කාර්යභාරය පුළුල් කිරීමේ අරමුණින් කෘෂිකර්ම පීඨ පිහිටා ඇති දිවයිනේ සියලුම විශ්වවිද්‍යාල සමඟ ශාස්ත්‍රීය හා පර්යේෂණ සහයෝගීතාවයන්ට එළඹීම සඳහා මූලික පියවර 2021 අගභාගයේ දී ගන්නා ලදී.

ගිවිසුම්වලට එළැඹීමට පාලක මණ්ඩලයේ ද අනුමැතිය ලැබී තිබේ.

ඒ අනුව 2022 වර්ෂයේ මුල් කාර්තුව තුළ රුහුණු විශ්වවිද්‍යාලය සහ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළැඹීමට අප ආයතනයට හැකි විය. 2022 ජනවාරි මස 07වන දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සහ රුහුණු විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබුණි. රුහුණු විශ්වවිද්‍යාලයේ උප කුලපති සුජීව අමරසේන සහ අප ආයතනයේ අධ්‍යක්ෂ මාලින්ද සෙනෙවිරත්න යන මහත්වරු තම ආයතන වෙනුවෙන් ඒ සඳහා අත්සන් තැබූහ.

සරසවි සිසුන්ට සීමාවාසික පුහුණුව අවස්ථා ලබා දීම, ආයතන දෙක අතර පර්යේෂණ සහයෝගීතාවයන් සඳහා අවස්ථා උදා කර ගැනීම, දැනුම හුවමාරුව, අධ්‍යාපන වැඩසටහන්, පර්යේෂණ හා පුහුණු අවස්ථා සලසා ගැනීම මෙහි අරමුණයි.

උක්ත අරමුණු ඉටු කර ගැනීමේ අරමුණින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සමඟ පෙබරවාරි මස 09 වන දින අවබෝධතා ගිවිසුමකට එළැඹුණි.

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ජයන්ත ලාල් රත්නසේකර මහතා සහ අප ආයතනයේ අධ්‍යක්ෂ මාලින්ද සෙනෙවිරත්න යන මහත්වරු මෙම ගිවිසුමට අත්සන් තැබූහ.

## කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පර්යේෂණ හා පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමේ වැඩමුළුවක්





හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (SLCARP) එක්ව කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පර්යේෂණ හා පුහුණු අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතා ප්‍රමුඛතාගත කිරීමේ වැඩමුළුවක් සාර්ථකව සංවිධානය කරන ලදී. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන "සෞභාග්‍යයේ දැක්ම" සහ පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය පිළිබඳ මෑතකාලීන රජයේ ප්‍රතිපත්තිමය මුලපිරීම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම එහි අභිමතාර්ථය විය. ජාතික වශයෙන් වැදගත් වන මෙම අවස්ථාවට රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නියෝජිතයෝ රැසක් සහභාගී වූහ.

සාකච්ඡා සැසි සහ ඉදිරිපත් කිරීම් තේමාත්මක ක්ෂේත්‍ර පහක් යටතේ පැවැත්විණි:

1. කෘෂි විද්‍යාව සහ ශාක පෝෂක කළමනාකරණය
2. බෝග වැඩිදියුණු කිරීම,
3.ශාක ආරක්ෂණය,
4.පශ්චාත් අස්වනු තාක්ෂණය
5.සමාජ-ආර්ථික පර්යේෂණ සහ පුහුණුව.

මෙම වැඩමුළුව 2022 ජනවාරි 20 වන දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේ නාරායනසාමි සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි.

# වියළි කලාපයේ දේශගුණික විපර්යාස පිළිබඳ විද්වත් මත විමසීමට වැඩමුළුවක්





දේශගුණික විපර්යාසයන් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ජනතාව කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ වැඩමුළුවක් 2022 ජනවාරි මස 27 වෙනි දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී පැවැත්වුණි.

මෙම වැඩමුළුව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සහ රජරට විශ්වවිද්‍යාලය එක්ව සිදුකරනු ලබන ‘ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික අවදානම් කණ්ඩායම්වල දේශගුණික අනුහුරුතාව සහ දේශගුණික අනුහුරු ගොවිතැන් පිළිවෙත් පිළිබඳ අධ්‍යයනය’ නම් පර්යේෂණ අධ්‍යයනයට සමගාමීව සංවිධානය කරන ලදී. වර්ල්ඩ් විෂන් ලංකා (World Vision) ආයතනය එම අධ්‍යයනය සඳහා මූල්‍ය සහයෝගීතාව දක්වයි.

බෝග නිෂ්පාදනය, පශු සම්පත්, මිරිදිය ධීවර, සෞඛ්‍ය සහ පෝෂණය, ළමා අධ්‍යාපනය, වනසත්ව හානි ඇතුළු විවිධ ක්ෂේත්‍ර කෙරෙහි දේශගුණික විපර්යාසයන්හි බලපෑම් පිළිබඳ විශේෂඥ අදහස් ලබා ගැනීම සහ ක්ෂේත්‍ර මට්ටමේ අත්දැකීම් හුවමාරු කර ගැනීම මෙම වැඩමුළුවේ ප්‍රධානතම අරමුණ විය.

## HARTI පුවත්

## 2022 වර්ෂයේ රාජකාරී ආරම්භ කිරීම

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ කාර්ය මණ්ඩලය 2022 වර්ෂය සඳහා රාජකාරී ආරම්භ කිරීම අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී මාලින්ද සෙනෙවිරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් ජනවාරි (03) සිදු කෙරිණි. මෙම අවස්ථාව සිහිපත් කරමින් අධ්‍යක්ෂතුමා ආයතන පරිශ්‍රයේ සඳුන් පැළයක් රෝපණය කළේය.

රාජ්‍ය සේවක ප්‍රතිඥාව කියවීමෙන් අනතුරුව කාර්ය මණ්ඩලය ඇමතූ අධ්‍යක්ෂතුමා සඳහන් කළේ 2022 වර්ෂය සාර්ථක කර ගැනීම සඳහා පොදු අරමුණකින් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වන බවයි.

කොවිඩ් වසංගත තත්ත්වය තුළ සංචරණ සීමා තිබිය දී ආයතනයේ කටයුතු නිසි ලෙස පවත්වා ගෙන යාම සඳහා වැඩි දින ගණනාවක් රාජකාරියට වාර්තා කරමින් කැපවීමෙන් කටයුතු කළ සේවක මහත්ම මහත්මීන් දස දෙනෙකු ඇගයීමට ලක් කිරීම ද එදින සිදු විය.

රාජකාරී ආරම්භ කිරීමේ කෙටි උත්සවයෙන් පසු සුබ සාධක සංගමය විසින් ආයතනයේ කාර්ය මණ්ඩලයට සෙත්පතා මහා සංඝරත්නය වැඩම කරවා සෙත් පිරිත් සජ්ඣායනය කිරීම ද සිදු කරන ලදී.





# ශ්‍රී ලංකාවේ පොහොර සහ අනෙකුත් කෘෂි රසායන සම්බන්ධ වත්මන් ප්‍රතිපත්ති සහ එමඟින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ඇතිවී ඇති බලපෑම

ශ්‍රී ලංකා රජය සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුවේ සඳහන් කර ඇති පරිදි වස විසෙන් තොර සෞඛ්‍යාරක්ෂිත ආහාර මඟින් සෞඛ්‍ය සම්පන්න සහ ඵලදායී දේශයක් ගොඩනැගීමේ අභිලාෂය ඇතිව හරිත කෘෂිකාර්මික ව්‍යාපාරයක් ප්‍රකාශයට පත් කරන ලද අතර එහි එක් පියවරක් ලෙස රසායනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ද්‍රව්‍ය මෙරටට ආනයනය කිරීම තහනම් කරමින් 2021 අංක 7 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිය පනවන ලදී. අවශ්‍ය පරිදි රසායනික පොහොර නොමැති වීම තම ජීවිත කාලය පුරාවට රසායනික යෙදවුම් පාදක කෘෂිකාර්මාන්තයකට පුරුදුව සිටි ගොවීන් හට අවිනිශ්චිත බවක් සහ නොසන්සුන්තාවයක් ඇති කළේය.

කාබනික කෘෂිකාර්මාන්තයට පහසුකම් සැලසීම සඳහා රජය සහනාධාර ලබා දීමෙන් මෙන්ම විවිධ කාබනික සංශෝධන ආනයනය කරමින් දේශීයව කාබනික පොහොර නිෂ්පාදනය දිරිමත් කළේය. එම පොහොර ක්ෂේත්‍රයේ බෙදා හැරීමේ හා භාවිතයේ අක්‍රමිකතා වාර්තා වුවද, බොහෝ ගොවීන් තම වගාව දිගටම කරගෙන ගියහ. දැනට ගොවීන් අස්වනු නෙළීමේ ක්‍රියාවලියේ යෙදී සිටින අතර අස්වැන්න සම්බන්ධයෙන් ධනාත්මක සහ ඍණාත්මක ප්‍රතිඵලයන් වාර්තා වෙමින් තිබේ.

ක්ෂේත්‍රයේ යථාර්ථය විද්‍යාත්මකව අධ්‍යයනය කරමින් රජයේ හරිත කෘෂිකාර්මික ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන යාම අවශ්‍ය ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම් සැපයීමේ ආයතනික වගකීම අවබෝධ කරගනිමින් විවිධ කෘෂි ක්ෂේත්‍රයන්හි නියැළෙන ගොවීන් අරමුණු කර ගනිමින් අධ්‍යයනයක් දියත් කිරීමට පරිසර පද්ධති අංශය විසින් සැලසුම් කර ඇත.

යෝජිත අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ වී, අනෙකුත් ආහාර බෝග, අපනයන පාදක කෘෂි බෝග හා මල් වගාව ආශ්‍රිත නිෂ්පාදනය, ගෘහස්ථ ආර්ථිකය, ආහාර සුරක්ෂිතතාව සහ ඒ ආශ්‍රිත ගොවි ප්‍රජාවන්ගේ සමස්ත යහපැවැත්මට මෑත කාලීන පොහොර ප්‍රතිපත්ති වෙනස් වීමේ ඍජු හා වක්‍ර බලපෑම් හඳුනා ගැනීමයි. මෙම අධ්‍යයනයේ සොයාගැනීම් රජයේ හරිත කෘෂිකාර්මික ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශයක් සැපයීමේ පදනම ලෙස ක්‍රියා කරනු ඇත.

## දත්ත කළමනාකරණ අංශය වැඩ අරඹයි

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වෙනස්වීම්වලට අනුගත වෙමින් ජාතික පර්යේෂණ ආයතනයක් වශයෙන් වැඩි දායකත්වයක් සැපයිය හැකි ආකාරයට ආයතනයේ විවිධ අංශ ප්‍රතිව්‍යුහගත කිරීම 2021 වර්ෂයේ සිදු කරනු ලැබිණි. ඒ අනුව ආයතනයේ පර්යේෂණ අංශ තොරතුරු හා දත්තවලින් පෝෂණය කිරීම හා දත්ත විශ්ලේෂණය කිරීම සඳහා දත්ත කළමනාකරණ අංශය ස්ථාපිත කරනු ලැබිණි. වසර 50කට ආසන්න ඉතිහාසයක් පුරා, පර්යේෂණ දත්ත හා තොරතුරු ප්‍රතිපත්ති සම්පාදකයන්ට, පර්යේෂකයන්ට, විශ්වවිද්‍යාලවලට, රාජ්‍ය හා පුද්ගලික අංශයේ ආයතනවලට මෙන්ම ගොවි ප්‍රජාවට ලබා දීම තුළින් රටේ ගොවිජන ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා ම හැගි කාර්යභාරයක් ඉටු කළ අතර දත්ත හා තොරතුරු ලබා දීමේ කටයුතු තවදුරටත් පුළුල්ව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා දත්ත කළමණාකරන අංශය ස්ථාපිත කරන ලදි.

ආහාර පද්ධති අංශය හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන අලෙවිකරණ ව්‍යාපෘතියෙහි දත්ත එක්රැස් කිරීම, සැකසීම, විශ්ලේෂණය කිරීම හා වාර්තා සැකසීම සම්ප්‍රදායිකව සිදුකරන ක්‍රමවේදය වෙනුවට වැඩි දියුණු කළ ස්වයංක්‍රීය ක්‍රමවේදයක් සහිත අන්තර්ජාල මෘදුකාංගයක් නිර්මාණය කිරීම දත්ත කළමනාකරණ අංශය විසින් මේ වන විට සාර්ථකව සිදු කරමින් සිටියි. එහි නිර්මාණ කටයුතු වලින් 95%ක් පමණ මේ වන විට අවසන් බව එම අංශයේ අංශ ප්‍රධාන ප්‍රසන්න විජේසිංහ මහතා සඳහන් කළේය.

මීට අමතරව දත්ත කළමනාකරණ අංශය යටතේ විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් හට දත්ත කළමනාකරණය හා විශ්ලේෂණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව ලබා දීම ද සිදුකෙරේ. ආහාර පද්ධති අංශය විසින් දෛනිකව, සතිපතා, මාස්පතා සම්පාදනය කරන මිල තොරතුරු විවරණිකා සඳහා අවශ්‍ය දත්ත සම්පාදනය කරනුයේ ද දත්ත කළමනාකරණ අංශය විසිනි.

# පුහුණු පුවත්







ග්‍රාම සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සහ කළමනාකරණය සඳහා ප්‍රජා සහභාගීත්ව ක්‍රමවේදය භාවිතා කිරීම පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහා සංවිධානය කළ පුහුණු වැඩසටහනක් අධ්‍යාපන හා පුහුණු අංශය විසින් පසුගියදා සාර්ථකව අවසන් කරන ලදී. කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුබද්ධ දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් හා දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරින් සහ කෘෂිකර්ම අමාත්‍යංශයේ ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයීම් ඉලක්ක කර ගනිමින් තලාතුඔය ප්‍රදේශයේ නුගලියැද්ද පහළ ගම්මානය සහ ඇතුල්ගම නැගෙනහිර ගම්මානයේ දී තෙදින නේවාසික වැඩසටහනක් වශයෙන් මෙය පැවැත්වුණි.

2022 පෙබරවාරි මස 06 වෙනි දින සිට 10 වෙනි දින දක්වා පුහුණු වැඩසටහන පැවැත්වුණි. ප්‍රජා සහභාගීත්වය තුළින් ග්‍රාමීය සංවර්ධනය සඳහා ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිළිබඳ මූලික සංකල්ප හා ක්‍රමවේදයන් සම්බන්ධව න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම හා හැකියා වර්ධනය කිරීම පුහුණු වැඩසටහනේ මූලික පරමාර්ථය වේ.

පුහුණු වැඩසටහනේ සම්පත් දායකයින් ලෙස අධ්‍යාපන හා පුහුණු අංශයේ අංශ ප්‍රධාන පර්යේෂණ නිලධාරී චින්තක ජයසූරිය මහතා, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී චතුර ජයම්පති ද සිල්වා, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී සිදත් බණ්ඩාර මහතා, දත්ත කළමනාකරණ අංශයේ අංශ ප්‍රධාන ප්‍රසන්න විජේසිංහ මහතා, පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් මහතා ඇතුළු පිරිස සහභාගී වූ අතර බාහිර සම්පත්දායකයෙකු ලෙස ආර්.එල්.එන් ජයතිස්ස මහතා ද සහභාගී විය.

# සුහද ක්‍රිකට් ගැටුම







හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ කාර්යමණ්ඩලය අතර පැවැත්වෙන වාර්ෂික සුහද ක්‍රිකට් ගැටුම පසුගිය මාර්තු 26 රාජගිරිය කලපලුවාව සිද්ධාර්ථ විද්‍යාලයීය ක්‍රීඩා පිටියේ දී පැවැත්විණි.

නිමල් ගුණරත්න මහතාගේ නායකත්වයෙන් යුතු කණ්ඩායම පිරිමි ශූරතාවය දිනාගත් අතර කාන්තා ශූරතාවය දිනාගත්තේ දීප්තිකා රූපසිංහ මහත්මිය නායකත්වය දැරූ කණ්ඩායමයි.

තරඟාවලියේ වීරයා ලෙස සම්පත් සාලියරත්න මහතා අධ්‍යක්ෂතුමා අතින් ජයග්‍රාහී කුසලානය දිනා ගත් අතර එහි කාන්තා කුසලානය නිරෝෂා මෙනෙවිය දිනා ගත්තාය.


කාන්තා සහ පිරිමි අනුශූරතාවයන් දිනාගනු ලැබුයේ පිළිවෙළින් නිරෝෂා මහත්මියගේ සහ ඩිල්ෂාන් මහත්මාගේ නායකත්වයෙන් යුතු කණ්ඩායම්ය.

සුහද ක්‍රිකට් ගැටුම ආයතනයේ කාර්යමණ්ඩලය අතර කණ්ඩායම් හැඟීම සහ ක්‍රීඩා හැකියා ඔප්නංවා ගැනීමට සහය වීමේ අරමුණින් වාර්ෂිකව සුබ සාධක සංගමය විසින් සංවිධානය කරනු ලබයි.

| | | |
|---|---|---|
| වැඩිම ලකුණුලාභියා | - | දිනූෂ දිල්ෂාන් |
| දක්ෂතම පිතිකරු | - | හංස යසරත්න |
| වැඩිම කඩුළුලාභියා | - | නුවන් වර්ණසූරිය |
| හොඳම පන්දු රකින්නා | - | බී.ආර්.සී බණ්ඩාර |


**සියලු විමසීම්**
**අධ්‍යක්ෂ**
**ගොවිකටයුතු පුවත් හසුන**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු**
**කිරීමේ ආයතනය**
**අංක 114, විජේරාම මාවත,**
**කොළඹ 07**

## නව ප්‍රකාශන

























**උපදේශකත්වය**
මාලින්ද සෙනෙවිරත්න
ප්‍රධාන විධායක නිලධාරී/අධ්‍යක්ෂ

**අධීක්ෂණය**
ආචාර්ය එන්.පී.ජී. සමන්ත

**සම්පාදනය**
වසන්ති රාජපක්ෂ
ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනී

**නිර්මාණකරණය**
උදේනි කරුණාරත්න
පරිඝනක අකුරු සැකසුම්කරු